**1991 අංක 02 දරණ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා (සංශෝධන) ප්‍රඥප්තිය**

# THE ROAD PASSENGER CARRIAGE SERVICES (AMENDMENT) STATUTE NO; 02 OF 1991

1990 අංක 01 දරණ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන කිරීමේ සේවා ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තිය.

බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තියේ 1991 අංක 02 දරණ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

1990 අංක 01 දරණ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තිය සංශෝධනය කිරීම.

2. 1990 අංක 01 දරණ බස්නාහිර පළතේ මාර්ගස්ථ මගීන් ප්‍රාවාහනය කිරීමේ ප්‍රඥප්තියේ 4(1) වගන්තිය ඒකාබද්ධ කරන ලදී. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද 1995 අංක 38 දරණ පෞද්ගලික බස්රථ සංශේධිත පනතින් සංශෝධිත හෝ ඇතුලත් කරනු ලැබූ 1983 අංක 44 දරණ පෞද්ගලික බස්රථ සේවා පනතේ 28 "අ" වන වගන්තිය බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වීම නැවැතිය යුතුය. ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය 1990 අංක 01 දරණ බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කිරීමේ සේවා ප්‍රඥප්තියේ 4(2) වගන්තියට ඉක්බිතිවම ඇතුලත් කළ යුතුය.

3. පෞද්ගලික බස්රථවල පාවිච්චිය පිණිස බස්නාහිර පළාත් තුල සලසා ඇති බස් නැවතුම් පොළක් පාවිච්චි කිරීම සඳහා පෞද්ගලික බස් රථයකින් එක් දිනකට රු. 10.00 කට යටත්ව ගාස්තුවක් බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් කළ අය කළ හැකිය.